ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය

இலங்கை புடவை மற்றும் ஆடை நிறுவகம்

Sri Lanka Institute of Textile and Apparel

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

2021





State Ministry of Batik, Handloom Textile & Local Apparels Products
Kandawala Estate, No.02, General Sir John Kotelawala Mawatha, Ratmalana,
Sri Lanka.
Phone : +94 11 26 32 406, +94 11 26 36 917 Fax : +94 11 26 36 337, +94 11 26 22 897
E-Mail : info@slita.ac.lk Web : www.slita.ac.lk

SLITA

Sri Lanka Institute of Textile & Apparel

State Ministry of Batik, Handloom and Local Apparel Products

දැක්ම

“ජේෂකර්ම, ඇඟලුම් හා සම් නිෂ්පාදන ආශ්‍රිත කාර්මික ක්ෂේත්‍රයන්හි කාර්ය මණ්ඩල ප්‍රවීණතාවය වැඩිදියුණු කිරීම හා උපදේශන සේවා සැපයීම, පරීක්ෂණ, පර්යේෂණ සහ සංවර්ධන සහ නවෝත්පාදන සිදුකිරීම සඳහා ගෝලීය වශයෙන් පිළිගැනීමට ලක්වූ ආයතනයක් බවට පත්වීම”

මෙහෙවර

“තිරසාර සංවර්ධනය අපේක්ෂාවෙන් ඵලදායීතාව, භාණ්ඩ හා සේවාවල ගුණාත්මකභාවය හා රෙදිපිළි, සම් භාණ්ඩ නිෂ්පාදන , ඇඟලුම් ආශ්‍රිත කර්මාන්තවල සාමූහික අගය ඉහළ නැංවීම සඳහා ප්‍රවීණතාවයෙන් හෙබි, මනා පුහුණුවක් සහිත මානව ප්‍රාග්ධනය, විශ්වසනීය විශේෂඥ දැනුම හා නව්‍ය විසඳුම් ඉදිරිපත් කිරීම”

අරමුණු

- පශ්චාත් උපාධි සහ උපාධි පාඨමාලා පැවැත්වීම සහ පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ නිරතවූවන් සඳහා ඩිප්ලෝමා මට්ටමේ අධ්‍යාපනය, පුහුණුව සහ උපදේශනය සහ තාක්ෂණික සේවා සැපයීම.

- පේෂකර්ම සහ ඇඟලුම් තාක්ෂණ කළමනාකරණයෙහි සහ වෙනත් ආශ්‍රිත ක්ෂේත්‍රයන්හි ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම සහ ඒ සම්බන්ධයෙන් සහතික ප්‍රදානය කිරීම. තවද, පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ජාතික ප්‍රතිපත්තියක් සැකසීම සඳහා රජයට සහයෝගය ලබාදීම.

- විදේශීය ආයතන, කර්මාන්ත සහ රසායනාගාර සමඟ සම්බන්ධතා ගොඩනගාගෙන ප්‍රතීතන සහ රසායනාගාර සේවා සපයමින් ක්ෂේත්‍රයෙහි උසස් ප්‍රමිතීන් පවත්වා ගනිමින් උසස් මට්ටමේ පාඨමාලා පැවැත්වීම.

- පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයෙහි උපාධි, පශ්චාත් උපාධි , ඩිප්ලෝමා සහ සහතිකපත්‍ර ප්‍රදානය කිරීමේ අරමුණින් දේශීය සහ විදේශීය විශ්වවිද්‍යාල සහ ආයතන සමඟ සම්බන්ධතා ඇතිකරගැනීම.

- රජයේ ආයතන, දේශීය සහ විදේශීය අධ්‍යයන සංවිධාන, ආයතන හා කර්මාන්ත සමඟ සහයෝගීත්වයෙන් පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ පර්යේෂණ සිදුකිරීම සහ නිෂ්පාදන වැඩිදියුණුකිරීම, ප්‍රවර්ධනය කිරීම.

- පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්ත ක්ෂේත්‍රයට සම්බන්ධ පරීක්ෂණ සහ වෙනත් ආශ්‍රිත තාක්ෂණික සේවා ගාස්තු ගෙවීමේ පදනම මත දේශීය සහ විදේශීය ආයතන සහ දේශීය සහ විදේශීය සිසුන් වෙත සැපයීම.

- පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය විසින් භාවිතා කරනු ලබන පිරියත සහ යන්ත්‍ර පිළිබඳ වෙළඳපොළ සමීක්ෂණ, තාක්ෂණික සහ ආර්ථික ශක්‍යතා අධ්‍යයන, ව්‍යාපෘති ඇගයීම් සහ තක්සේරු පැවැත්වීම.

- පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදනය, ආනයනය සහ අපනයනය සහ වෙනත් තාක්ෂණික තොරතුරු ඇතුළත් දත්ත සංචිතයක් පවත්වාගෙන යාම.

- පේෂකර්ම හා ඇඟලුම් කර්මාන්තයේ නිරතවූවන් සඳහා ජාත්‍යන්තර, ජාතික සහ සමාගම් අනුකූලතා පද්ධති ප්‍රමිතීන් පිළිබඳ අනුකූලතා සහතික නිකුත් කිරීම.

අපගේ සේවාවන්

පුහුණු කිරීම



පරීක්ෂණ කටයුතු



තාක්ෂණික සේවා



තාක්ෂණික ව්‍යාපෘති සහ උපදේශනය



ආයතනික තොරතුරු

ආයතනයේ නම	:	ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය
ලිපිනය	:	කඳවල වත්ත අංක 02 ජනරාල් සර් ජෝන් කොතලාවල මාවත, රත්මලාන
ලියාපදිංචිය	:	වර්ෂ 2009 අංක 12 දරණ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් පනත
නෛතික ස්වරූපය	:	ව්‍යවස්ථාපිත මණ්ඩලය
රේඛීය අමාත්‍යාංශය	:	බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
අධ්‍යක්ෂ මණ්ඩලය	:	බී.එල්.ඒ.ජේ.ධර්මකීර්ති මහතා (සභාපති) යොහාන් ලෝරන්ස් මහතා ඒ.ජී.නිශාන්ත මහතා කේ.එච්.බන්දුල ප්‍රනාන්දු මහතා ෆීලික්ස් ප්‍රනාන්දු මහතා සුරේෂ් ඉන්දික මහතා කේ.ජී.ආර්.විමලසූරිය මහතා චන්දන පුෂ්පකුමාර මහතා
විගණක	:	විගණකාධිපති දෙපාර්තමේන්තුව
දුරකථන අංක	:	2632406 / 2636336
ෆැක්ස් අංකය	:	2636337
විද්‍යුත් ලිපිනය	:	director@textile-clothing.lk info@slita.lk
වෙබ් අඩවිය	:	www.slita.lk

පටුන

	පිටුව
සභාපතිතුමාගේ පණිවිඩය	1
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය	2
අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම් පිළිබඳ ප්‍රකාශය	3
අවදානම් විශ්ලේෂණ වාර්තාව	4
ආයතනය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු	5 - 7
කාර්යසාධනයේ විශේෂ අවස්ථා	8 – 9
ගිණුම්කරණ ප්‍රතිපත්ති	10 – 12
පොදු අනාවරණය කිරීම	13 - 15
මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය	16
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය	17
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	18
ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය	19
මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්	20 - 33
කාර්යසාධන දර්ශක	34 - 35
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වාර්තාව	36 - 39
අංශ අනුව ආදායම් / වියදම් බෙදීම	40
2021 වර්ෂයේ ක්‍රියාකාරකම්	41 – 47
2022 වර්ෂයේ ඉදිරි සැලසුම්	48
විගණකාධිපති වාර්තාව	49 - 55

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇහලුම් ආයතනයේ සභාපතිතුමාගේ පණිවිඩය

ශ්‍රී ලංකාවේ ඇහලුම් කර්මාන්තය වනාහි රටට විදේශ විනිමය උපයා දෙනු ලබන, ප්‍රමුඛ පෙළේ ඒකීය සාධකයක් ලෙස ආර්ථික සංයුතිය සකස් කරන, අද පවත්නා තත්ත්වය අනුව අද්විතීය භූමිකාවක් තුල ක්‍රියා කරනු ලබන අංශයකි. අප රටේ දැක්ම සමඟ ඉදිරියට යමින්, සංවර්ධනය කළ යුතු වඩාත් විභවයක් සහිත කර්මාන්තය ලෙස රජය විසින් සළකුණු කරන ලදුව, රටට විදේශ විනිමය උත්පාදනය කරනු ලබන එක්සත් ජනපද ඩොලර් බිලියන් 06ක ඉලක්කයක් කරා පිය නගන ප්‍රධානත ම නිර්යාත වෙළඳ භාණ්ඩයකි. මේ අනුව ගත්කළ, කර්මාන්තය, සිය ප්‍රමිතිය, ප්‍රවාහනය, සහ අන්තර්ජාතික වෙළඳපොළෙහි ගෝලීය තරඟකාරීත්වයට මුහුණ දීම සඳහා වන අන්තර්ජාතික ප්‍රමිතීන් පවත්වා ගැනීම යන අභියෝග වලට මුහුණ දෙනු ලබයි. මේ අතර, ඇහලුම් කර්මාන්තයෙන් උපයන විදේශ විනිමයෙහි ඇගයිය යුතු මට්ටමේ වර්ධනයක් පෙන්නුම් කරන අතර, රටේ නිර්යාත ආදායමෙහි සැලකිය යුතු කොටසක් මෙමඟින් පෙන්නුම් කරමින් GSP+ තත්ත්වයන් හි වර්ධනයක් පෙන්නුම් කරනුයේ ගෝලීය වෙළඳපොල තුල දැඩි ලෙස ප්‍රමිතිය පිළිබඳ මිනුම් උපයෝගී කර ගන්නා පසුබිමක් තුලයි. මෙම තත්ත්වය සාක්ෂාත් කර ගැනීම සඳහා, රටේ ශ්‍රම බලකායෙන් ලබා දෙන දායකත්වය සුළු පටු නොවේ. එබැවින්, කර්මාන්තය තුල පුහුණු ශ්‍රමය සඳහා පවත්නා රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් උත්පාදනය වී පවතී. මෙම තත්ත්වය, සත්තකින්ම රටේ තරුණ ප්‍රජාව සඳහා වැඩි වශයෙන් රැකියා අවස්ථා උදා කරලීම වෙනුවෙන් යොමු කළ හැකි වන පරිදි රාජ්‍ය ප්‍රතිපත්තිය සමඟ ගලපා ගැනීම කළ හැකි කරුණකි.

පසුගිය දශක කිහිපය තුලම, පේෂකර්ම හා ඇහලුම් ක්ෂේත්‍රයේ ප්‍රමුඛ පුහුණු ආයතනය ලෙස කටයුතු කරමින්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇහලුම් ආයතනය (SLITA) කර්මාන්තයේ අවශ්‍යතා සපුරාලමින් කටයුතු කරන අතර, ආයතනයෙහි වෘත්තීය කාර්ය මණ්ඩලය විසින් තරඟකාරී වෙළඳපොල තුල ඉහල ම ප්‍රමිතිය පවත්වා ගැනීම පිණිස සුදුසුකම් වලින් සන්නද්ධව සිටී. අපගේ සේවාවන් රෙදිපිළි සහ ඇහලුම් කර්මාන්තයේ අවශ්‍යතා අනුව ඉතා පුළුල් පරාසයක පැතිරුණා වූ, ශ්‍රම පුහුණුවේ සිට උපදේශන සේවා සහ රසායනාගාර පර්යේෂණ සිදු කිරීම දක්වා ම වූ තලයක පිහිටා ඇත. සිය සිසුන් වෙත නවීන පුහුණු පහසුකම් හඳුන්වාදීමත් සමඟ, පුහුණු හා නිපුනතාවෙන් යුත් ශ්‍රමය කර්මාන්තය වෙත දායාද කරනු ලබන ආයතනයක් ලෙස වඩාත් ශක්තිමත් වී ඇති බව පැවසීමට හැකි වීම ආයතනයට මහත් ආඩම්බරයකි. දැන් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇහලුම් ආයතනය (SLITA) අනාගතයේ ඇතිවිය හැකි අභියෝග වලට ශක්තිමත්ව මුහුණ දෙමින් ගෝලීය පරාමිතීන්හි පිහිටා අළුතින් ඇතිවන වෙළඳපොල තත්ත්වයන්ගෙන් එල්ල වන දැඩි තරඟකාරීත්වයට මුහුණ දීමට හැකි මට්ටමින් ගොඩ නැගී ඇත.

ආයතනයේ ගමන් මාර්ගය තුල මග පෙන්වමින් මෙහෙයවන සභාපතිවරයා ලෙස, නිරන්තරයෙන් තරඟකාරීත්වය වර්ධනය වන ගෝලීය වෙළඳපොල වෙත විභව්‍යයෙන් හා ශක්‍යතාවෙන් යුත් සේවයක් ඉටු කිරීම සඳහා ආයතනය සතුව හැකියාව පවත්නා බව මා හට ස්ථිරව පැවසිය හැකි වන අතර ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇහලුම් ආයතනයෙහි (SLITA) කාර්ය මණ්ඩලය විසින් සපයා දෙනු ලබන සහයෝගය මෙන්ම රේඛිය අමාත්‍යාංශයෙන් ලබා දෙනු ලබන නොමසුරු සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී.එල්.ඒ. ජානක ධර්මකීර්ති
සභාපති - ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇහලුම් **ආයතනය**
ලේකම් - බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇහලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පණිවිඩය

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA), එහි පූර්වගාමී ආයතන දෙක වන පේෂකර්ම අභ්‍යාස හා සේවා මධ්‍යස්ථානය හා ඇඟලුම් නිෂ්පාදන කර්මාන්ත අභ්‍යාස ආයතනය සමඟ සම්බන්ධ වීමෙන් අනතුරුව වඩා යහපත් ක්‍රියාවන්හි නියුතු වීම අරමුණු කර ගනිමින් පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාපිත ආයතනයක් බවට පත් විය. ඒ අනුව, ආයතනයක් ලෙස පසුගිය වසර කිහිපය පුරා ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA) සිය සාර්ථකත්වයේ / සංවර්ධනයේ මාර්ගය ඔස්සේ සිය ප්‍රධාන ව්‍යාපාරික කටයුතු කර්මාන්ත වෙත ලබා දෙමින් සිටී. සිය අවසන් ඉලක්කය කරා යන මාර්ගයේ දී, නිරන්තරයෙන් පුළුල් වන ගෝලීය වෙළඳපොල තුල ආයතනයට මුහුණ දීමට සිදුවන සහශ්‍රයේ අභියෝග බොහෝය. එනමුදු, පූර්වගාමීන්ගේ ඒකාබද්ධ වීම තුලින් පැණ නැගි කාලාන්තරයක් තිස්සේ උකහා ගත් අත්දැකීම් සම්භාරය මත ඇති වූ හැකියාව නිසා එකී සියලු අභියෝග පිළිගැනීමට ආයතනය පසුබට නොවේ.

ආයතනය වනාහි, මූලිකවම, කර්මාන්තයේ අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මූලික ව්‍යාපාරික සාධක සම්පාදනයෙහි ලා ශක්‍යතාවෙන් යුත් ඉහළම සුදුසුකම් වලින් හෙබි කාර්ය මණ්ඩල සාමාජිකත්වයෙන් යුතු කණ්ඩායමකින් සමන්විත අධ්‍යාපනික ආයතනයකි. කර්මාන්තයේ අපේක්ෂා ඉහළම තලයක පවත්නා බැවින්, කර්මාන්තයේ ඉල්ලුමට සරිලන පරිදි කටයුතු කිරීමට ආයතනය සෑම ප්‍රයත්නයක්ම දරනු ලැබේ. එහි ප්‍රතිඵලයක් ලෙස, අප ශ්‍රී ලංකාවේ පේෂකර්ම සහ ඇඟලුම් ක්ෂේත්‍රයේ විශිෂ්ඨත්වයේ කේන්ද්‍රස්ථානය බවට පත් වීම උදෙසා උපාධි ප්‍රදානය කිරීමේ හැකියාව ඇති කර ගැනීමට මූලික කටයුතු හා පියවර ගෙන ඇත. තවද, වැඩි සිසුන් පිරිසක් උසස් අධ්‍යාපන වේදිකාවන් වෙත නිරාවරණය කිරීමේ අභිලාශයෙන් යුතුව, ගිණිකොණ දිග ආසියාවේ උසස් අධ්‍යාපන ආයතන සමඟ ඒකාබද්ධ වීමේ ප්‍රයත්න වලට එළැඹීම කෙරෙහි ඇති අවස්ථා සොයමින් සිටී.

ඒ අතර, ආයතනය විසින් තරුණ ප්‍රජාවට සහ කර්මාන්තයේ නියුතු වූවන්ට සිය සාර්ථක වෘත්තීයභාවය සම්බන්ධයෙන් සතුටු වීමට ප්‍රස්ථාව සලසමින්, තම වෘත්තීය ඉදිරිගමන වඩාත් සාර්ථක කර ගැනීම වස් පුහුණු වැඩසටහන් ඔස්සේ වෘත්තීය සාර්ථකත්වය අත් කරගැනීමට ආයතනය දිරිගන්වයි. ශ්‍රී ලාංකිකයන් පමණක් නොව, පකිස්ථානය, ඉන්දියාව සහ බංගලාදේශය වැනි රටවල සිසුන් ද පාඨමාලා හැදෑරීම සඳහා ඇතුලත් වී සිටින අතර, අසල්වැසි රටවල ද නිපුනතා වර්ධනයෙහි ලා සිය සේවා ව්‍යාප්ත කිරීමට ලැබීම ආයතනික ඉතිහාසයේ වැදගත් සංධිස්ථානයක් බවට පත් වේ.

පූර්ව වර්ෂයෙහි පරීක්ෂණ, පුහුණු සහ උපදේශනයන් අංශයන්ගෙන් ලද ආදායම සමඟ සැසඳීමේ දී, 2020 වර්ෂයේ දී පර්යේෂණාගාර වලින් උත්පාදනය වූ ආදායම ඇගයිය යුතු ලෙස ඉහළ ගොස් පවතින අතර, එකී වර්ෂය සම්බන්ධයෙන් ගත්කළ පුහුණු ආදායම ඉහල ගොස් ඇති බව මනාව පිළිබිඹු වෙමින්, පසුගිය වර්ෂය සමඟ සැසඳීමේ දී උපදේශන සේවා වලින් උත්පාදනය වූ ආදායම නොවෙනස්ව ම පවතින බව පෙනී යයි. ඒ අතර, පූර්ව වර්ෂය සමඟ සැසඳීමේ දී, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනය විසින් උත්පාදනය කරන ලද මුළු ආදායම ඉහළ ගොස් ඇති බව පෙනී යයි. වර්ෂය තුල පවත්වන ලද පුහුණු පාඨමාලා සහ පවත්වන වැඩසටහන් වල විෂය මාලාව කර්මාන්තයේ අවශ්‍යතා අනුව සංශෝධනය කරනු ලැබූ අතර, පර්යේෂණාගාරයේ යටිතල පහසුකම් නවතම මුහුණුවරක් සහිත පහසුකම් වලින් සුපෝෂිතව වැඩි දියුණු කර ඇත්තේ ජාත්‍යන්තර ප්‍රමිතීන් වලට අනුකූල වන පරිදි ප්‍රමිතීන් ගැලපිය යුතු බැවිනි.

කර්මාන්ත අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනයෙහි (SLITA) කාර්ය මණ්ඩලය දක්වන සහයෝගය මම අගය කොට සලකමි. රටේ ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස, විශිෂ්ඨත්වය කරා ළඟා වීම සඳහා සභාපතිවරයා සහ පාලක සභාව විසින් සිදුකරනු ලබන අප්‍රතිහත ප්‍රයත්නයන් සහ දිරි ගැන්වීම් සම්බන්ධයෙන් මගේ හද පිරි කෘතඥතාව පුද කරමි. අවසන් වශයෙන්, ආයතනයෙහි නිලධාරීන් විසින් දක්වන ලද කැපවීම සම්බන්ධයෙන් මෙහි දී කෘතඥ පූර්වකව සඳහන් කිරීමට අවස්ථාව කර ගනිමින්, ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA) විශිෂ්ඨත්වය කරා සාර්ථක ගමනක යෙදෙන බව මම විශ්වාස කරමි.

වරලත් වාස්තු විද්‍යාඥ සරත් ප්‍රනාන්දු
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් **ආයතනය**

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම් පිළිබඳ ප්‍රකාශනය

ආයතනයේ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වගකීම්, විගණකවරුන්ගේ වගකීම්වලට වඩා වෙනස් වේ.

මුදල් පනතේ විධිවිධාන අනුව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් මූල්‍ය වර්ෂය අවසානයේදී ආයතනයේ කටයුතුවල තත්ත්වය සහ එහි මෙහෙයුම්වල ප්‍රතිඵල පිළිබඳ සත්‍ය සහ සාධාරණ දැක්මකින් යුතුව එක් එක් මූල්‍ය වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම අවශ්‍ය වේ.

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ස්ථාවර ආකාරයෙන් භාවිතා කර සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයක් මඟින් සහාය ලබා දී ඇති බවත් අදාළ වන පරිදි සුදුසු සියලුම ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා සලකනු ලබයි.

ආයතනයේ මෙහෙයුම් කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක වීමට ප්‍රමාණවත් සම්පත් ඇති බවත්, මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ආයතනයේ අඛණ්ඩ පැවැත්ම කෙරෙහි සැලකිල්ල යොමු කර ඇති බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වාස කරයි. තවද, ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණ නිරවද්‍යතාවයකින් හෙළිදරව් කිරීමට ප්‍රමාණවත් ගිණුම් වාර්තා ආයතනය විසින් පවත්වාගෙන යන බවට සහතික කිරීම සහ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන මුදල් පනතේ අවශ්‍යතාවලට අනුකූල වන බව සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට වගකීමක් තිබේ.

ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීමට සාධාරණ පියවර ගැනීම සහ මේ සම්බන්ධයෙන් වංචා සහ වෙනත් අක්‍රමිකතා වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට සුදුසු අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම පිළිබඳව නිසි සැලකිල්ලක් දැක්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වගකීම වේ.

මෙම ප්‍රකාශයේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂ ජනරාල්වරයා සිය වගකීම් ඉටු කර ඇති බව ඔහු විශ්වාස කරයි. එමෙන්ම, අධ්‍යක්ෂ ජනරාල්වරයා ද තම දැනුමට අනුව ශේෂ පත්‍රයේ දිනට ආයතනය විසින් කරන ලද සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් ගෙවා ඇති බව හෝ අදාළ ලෙස මූල්‍ය ප්‍රතිපාදන සපයා ඇති බව ද තහවුරු කරයි.

අවදානම් විශ්ලේෂණ වාර්තාව

කිසිදු ව්‍යාපාරයක් එයටම ආවේණික වූ ව්‍යාපාරික අවදානම් වලින් තොරව පවතින්නේ යැයි කිව නොහැකි අතර, ව්‍යාපාර කවයන් තුළ අවදානම් කළමනාකරණය පිළිබඳ සංකල්පය අනිවාර්ය කියවීමක් බවට පත්ව ඇත. ව්‍යාපාර කටයුත්තක් කරගෙන යාමේ දී අවදානම යනු ආවේණික ලක්ෂණයක් වන අතර ඊට අනුශාංගිකව මෙහෙයුම් කළමනාකරණ ක්‍රියාවලියේදී අවදානම් කළමනාකරණය අන්තර්ගත ලක්ෂණයක් බවට පත් වී ඇත.

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA) යනු ආයතනික ව්‍යුහය මනාව පිළිබිඹු කරන පාර්ලිමේන්තු පනතක් සම්මත වීමෙන් ස්ථාපිත වූ ව්‍යාපාරික ක්‍රියාවලියෙහි දී ඇතිවිය හැකි අවදානම් මෙහෙයවීම සඳහා මනාව සැකසුනා වූ නීතිමය රාමුවක් තුල කටයුතු කෙරෙන ව්‍යවස්ථාපිත ආයතනයකි. එහි ව්‍යාපාරික ස්වභාවය සම්බන්ධයෙන් සමීප විශ්ලේෂණයක් සිදු කරන විට, මෙහෙයුම්, වෙළඳපොළ සහ නියාමන අංශයන් හි අවදානම් බාණ්ඩ කිහිපයකට බඳුන්ව ඇති බව දැකිය හැකි වේ.

ව්‍යාපාරයේ ස්වභාවය ප්‍රාග්ධන ආයෝජනයන්ට සාපේක්ෂව කුඩා මට්ටමක පවත්නා විට, ඒ සමඟ බැඳුණා වූ අවදානම් ද අවම මට්ටමක පවත්නා අතර, වර්තමාන ව්‍යාපාර මෙහෙයවීම සඳහා වෙළඳපොළ අවදානම් ඉහළ මට්ටමක පැවතිය හැකිය. තවද, විකල්පයක් ලෙස, ව්‍යාපාරික කටයුතු වල පුළුල් පරාසයක් තුල මෙහෙයුම් කිරීම සඳහා ආයතනය විවිධ වූ මාර්ග ගවේෂණයෙහි නියුතු වෙමින් සිටී. තවද, මෙහෙයුම් අවදානම සම්භාවිතාවක් / විභව්‍යයක් සහිත සාධකයක් ලෙස පෙනී යන බැවින් ආයතනය විසින් නිරන්තර සමාලෝචන හරහා අපේක්ෂිත ප්‍රමිතිය පවත්වාගෙන යාමේ ප්‍රයත්නයක නියුතු වෙමින් සිටී. ඊට අමතරව, ව්‍යාපාරය මනාව ස්ථාපිත වූ ව්‍යාපාර සැලැස්මක් තුල සාර්ථකත්වය කරා ගමන් කරන විට මෙහෙයුම් අවදානම ආන්තික මට්ටමක පවතී. තවද, යම් අවදානම් පවතින්නේ නම්, එය මානව ප්‍රාග්ධනයට සම්බන්ධ වූ වරින් වර රජය මගින් ක්‍රියාත්මක කරන්නා වූ ප්‍රතිපත්ති හේතුවෙන් චලනය වන්නා වූ ඒවාය.

ආයතනය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව

හැඳින්වීම

පේෂකර්ම හා ඇඟලුම් ආශ්‍රිත සේවාවන් සැපයීමට ප්‍රසිද්ධියක් දරන ආයතන අතරින් ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (**SLITA**), පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය නියෝජනය කරන රජයේ සුවිශේෂී හස්තය වශයෙන් පුරෝගාමී ආයතනය ලෙස කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇති අතර පසුගිය දශක කිහිපය තුළ පේෂකර්ම හා ඇඟලුම් ක්ෂේත්‍රය ආශ්‍රිත ව්‍යාපාරික ලෝකය තුල කටයුතු කරනු ලබයි. මෙම ආයතනය පුහුණු, පරීක්ෂණ සහ තාක්ෂණික සහ උපදේශන සේවා ආදී සිය මූලික ව්‍යාපාරික මෙහෙයුම් තුළ අසමසම සේවා සපයමින් එහි සේවා ලබන්නන්ට ශක්තිමත් පැවැත්මක් ලබා දී සුවිශේෂී කර්තව්‍යයක් ඉටු කරනු ලබන අතර කර්මාන්තය ගොඩනැඟීමට සහ එහි විභවතාව සහ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා කර්මාන්ත අංශයේ සේවාවන් භාවිතා කරනු ලබයි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කර්මාන්තකරුවන්ට ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ස්ථාවර බවට පැමිණ අතිශය ලාභ උපයන තත්ත්වයට පත්වීම සඳහා ඔවුන්ගේ ම හැකියා මුවහත් කර ගැනීමට හැකි වී තිබේ. මෙම ප්‍රවණතාවය නොනැවතී අඛණ්ඩව පවතින අතර අපගේ සංවිධානයේ සහ දැනුම පිළිබඳ අභිප්‍රේරණ බලවේගය ලෙස අපගේ දායකත්වයෙන් නවතම කර්මාන්ත ඉල්ලීම් සහ අවශ්‍යතා සමඟ වර්ධනය වීමට අපේක්ෂා කරමු.

පේෂකර්ම සහ ඇඟලුම් කර්මාන්තයේ ගෝලීය වේදිකාව තුළ නිෂ්පාදන කාර්ය ක්ෂේත්‍රයෙහි නවීන තාක්ෂණික ක්‍රමවල වර්ධනයන් සමඟ ප්‍රවණතා ගතික සහ විප්ලවීය වන අතර පරිශීලකයින් ඔවුන්ගේ තෘප්තියට සරිලන සුදුසු ම නිෂ්පාදනය තෝරා ගැනීම සම්බන්ධයෙන් පෙර නොවූ විරූ ලෙස බුද්ධිමත් ය. එහි ප්‍රතිඵලයක් වශයෙන් නිෂ්පාදකයින් මේ වන විට වෙළඳපොළ කරා යැවෙන ස්වකීය නිෂ්පාදන ඒවා පරිශීලනය කරන්නන්ගේ රුචිකත්වයට ඔබින බව සහතික කරගැනීමට සුපරීක්ෂාකාරී ලෙස කටයුතු කරයි. පාරිභෝගිකයින් වෙළඳපොළේ අපූර්වත්වයෙන් යුතු සහ දෝෂ රහිත නිෂ්පාදන සොයන බැවින් අද වන විට නිෂ්පාදනය සහ පරිශීලකයින්ගේ මානසිකත්වය අතර පවතින්නේ තරඟයකි.

මෙම ක්‍රියාවලියේ දී ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය, පුහුණු ආයතනයක් වශයෙන් කර්මාන්තයට දූරදර්ශී නායකයින් බිහිකිරීමෙහිලා ප්‍රධාන වශයෙන් දායකත්වය සපයනු ලැබේ. නැඟී එන පේෂකර්ම හා ඇඟලුම් ආශ්‍රිත ව්‍යාපාරික ලෝකයට අවශ්‍ය මූලික ව්‍යාපාරික සේවා ලෙස පුහුණු කිරීම, පරීක්ෂණ කටයුතු සහ උපදේශන සේවා සපයන බැවින් මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනයෙහි කාර්යභාරය අතිශය වැදගත් වේ. ගෝලීය වෙළෙඳපොළ තුළ භාවිතයට නොගත් අවස්ථා සොයා බැලීම සඳහා ආයතනය මේ වන විට පාසල් හැර යන්නන් මෙන් ම කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවයේ නියුතු පුද්ගලයින් යන දෙපාර්ශවය ම වෙත කර්මාන්ත ක්ෂේත්‍රය තුළ ඉල්ලුමක් ඇති විවිධ විෂයයන් පිළිබඳව පුහුණුව ලබාදීමට සූදානමෙන් සිටියි.

ගෙවුණු වසර කිහිපය තුළ ආයතනය පුහුණු වැඩසටහන් පැවැත්වීම මඟින් සැලකිය යුතු ආදායමක් උපයාගෙන ඇති අතර පරීක්ෂණ කටයුතු මඟින් උපයාගත් ආදායම සාමාන්‍ය මට්ටමක පවතියි. ආයතනයට ඇතුළත්වන ශිෂ්‍ය සංඛ්‍යාව සත්‍ය ලෙස ම ශීඝ්‍රයෙන් ඉහළ යමින් දහස් ගණනකට ළඟා වෙමින් පවතින අතර ඉදිරි වසරවලදී සිසුන් ඇතුළත් කිරීම් වැඩි කිරීමට තවත් පහසුකම් සැලසුම් කර තිබේ. එමෙන්ම ඵලදායිතා සංකල්පය ජනප්‍රිය වෙමින් පවතින බැවින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපල තුළ තරඟ කිරීම සඳහා ඵලදායිතාවය වැඩිදියුණු කිරීම් අවශ්‍ය වන විශේෂිත පුහුණු වැඩසටහන් අදාළ කර්මාන්තයන්හි නියැලෙන්නන් වෙත පිරිනමනු ලැබේ. මීට සමගාමීව, අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කවල ප්‍රජාවන්ට දැනුම ලබා දීම සඳහා ගෘහ කර්මාන්ත සඳහා පුහුණු පාඨමාලා සැපයීම කෙරෙහි ආයතනය ස්වකීය සේවාවන් අතර ප්‍රධාන ස්ථානයක් ලබා දී තිබෙන අතර එම ප්‍රදේශයන්හි ප්‍රජාවට ධරණීය සංවර්ධනය ඔස්සේ සිය ජීවන මට්ටම් ඉහළ නංවා ගැනීමට අවස්ථාව හිමි වී තිබේ. ආයතන සංවර්ධන මාවතේ ප්‍රගතිය කරා ගමන් කරමින් සිටින බැවින් ආයතනයට වර්ධනය වීමට විශාල ව්‍යාපාරික අවස්ථා රැසක් උදා කිරීම කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වා තිබේ.

පාලක මණ්ඩලය

ආයතනයේ ප්‍රතිපත්ති හා නීතිරීති සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය පාලක මණ්ඩලය වෙත පැවරී ඇති අතර එම තීරණ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. පාලක මණ්ඩල රැස්වීම් මාසිකව පැවැත්වෙන අතර ප්‍රගතිය සහ ක්‍රියාකාරකම් සහ ආයතනයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධ නිශ්චිත මාර්ගෝපදේශ සමාලෝචනය කිරීමත් මෙහි දී සිදු කෙරේ.

2021 දෙසැම්බර් මස 31 දිනට අධ්‍යක්ෂ මණ්ඩලය

1	බී.එල්.ඒ.ජේ.ධර්මකීර්ති මහතා	සභාපති	බතික්, අත්යන්ත්‍ර රෙදි සහ දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශය
2	යොහාන් ලෝරන්ස් මහතා	සාමාජික	ඒකාබද්ධ ඇඟලුම් සංගම් සංසදය
3	ඒ.ජී.නිශාන්ත මහතා	සාමාජික	මුදල් අමාත්‍යාංශය
4	කේ.එච්.බන්දුල ප්‍රනාන්දු මහතා	සාමාජික	රෙදිපිළි අපනයනකරුවන්ගේ සංගම් මණ්ඩලය
5	ෆිලික්ස් ප්‍රනාන්දු මහතා	සාමාජික	ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනකරුවන්ගේ සංගමය
6	සුරේෂ් ඉන්දික මහතා	සාමාජික	ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය
7	කේ.ජී.ආර්.විමලසූරිය මහතා	සාමාජික	කර්මාන්ත අමාත්‍යාංශය
8	චන්දන පුෂ්පකුමාර මහතා	සාමාජික	ඇඟලුම් නිෂ්පාදන කර්මාන්තය

2021 දෙසැම්බර් මස 31 වන දිනට කාර්ය මණ්ඩලය

මුළු කාර්ය මණ්ඩලය – 95

කාණ්ඩය	කළමනාකරණ හා මෙහෙයුම්	තාක්ෂණික/ මෙහෙයුම්	මූල්‍ය	පොදු/ පරිපාලන
සේවකයන්	05	49	04	29
අභ්‍යාසලාභීන්	-	5	-	-
පැවරුම්	-	2	1	-

පී.සරත් ඩබ්ව්.කේ. ප්‍රනාන්දු මහතා - අධ්‍යක්ෂ ජනරාල්
B.Sc (BE), M.Sc (Arch), RIBA, AIA (SL)

එස්. ඉලංගෝවන් මහතා - අධ්‍යක්ෂ (පුහුණු සහ තාක්ෂණ)
B.Sc. (Eng.) (Text), MBA, AMIE (SL)

පී.වී.එස්. විජයරත්න මහතා - අධ්‍යක්ෂ (මෙහෙයුම්)
M.Sc. (MIT), M.Sc (Mgt.), B.Tech(Eng.)Hons
AMIE (SL), LLB

එම්.පී.කන්නන්ගර මහතා - නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන)
MBA (P.I.M.)
B.Sc. (Col.), PG. Dip in International Rel:(BCIS)
Dip.in American Professional Qualification-HRM
LLB (UG), Diploma in Legal Studies.

ඊ.ඩබ්ලිව්.ඒ.අයි. සිරිවර්ධන මහතා - ගණකාධිකාරී
B.Sc Business Administration (Special), IBSL, LICA

කේ.පී.එම්.පෙරේරා - අභ්‍යන්තර විගණක
B.Sc. Management

ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය (තාක්ෂණික)

ජී.කේ.කේ.එස්.කුමාර මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Eng.) (Text), MBA, AMIE (SL)

බී.එල්.එස්.පී.නිශාන්ත මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Hons.), M.Sc. (Text.)

කේ.ඒ.ආර්.වී.අබේවර්ධන මිය - ප්‍රධාන තාක්ෂණඥ, NDT (Text. Tech.)

කේ. ජෙගදීසන් මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Eng.)(Text),M.Sc.(Text),AMIE(SL)

ඩබ්ලිව්.එම්.එස්.කේ.විජේබාහු මහතා - ප්‍රධාන තාක්ෂණඥ, B.Sc. (Eng.),M.Sc (Text),AMIE(SL)

කාර්යසාධනයේ විශේෂ අවස්ථා

1. මූල්‍ය කාර්යසාධනය





2. භෞතික කාර්යසාධනය





ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී උපයෝගී කරගන්නා ලද ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ:

1. පිළියෙළ කිරීමේ පදනම

(i) උපචිත පදනම මත ගිණුම්කරණය සඳහා මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් අනුකූල වේ. ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති අතර සමස්ත කාලසීමාව පුරාම ගිණුම්කරණ ප්‍රතිපත්ති නිරතුරුවම භාවිතා කර තිබේ.

(ii) ලිත් වර්ෂය ආයතනයේ මූල්‍ය වර්ෂය වේ.

(iii) ආයතනයේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් 1971 අංක 38 දරන මූල්‍ය පනත අදාළ කරගනු ලැබේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති

1. දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් හැර සියලුම යටිතල පහසුකම් දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැය/ගණනය කළ මිලෙන් සමුච්චිත ක්ෂය අඩු කර දක්වා ඇත.

පිරිවැය ගණනය කිරීමේදී වත්කමක් එහි අපේක්ෂිත භාවිතය සඳහා සුදුසු තත්ත්වයට ගෙන ඒම වෙනුවෙන් දරන ලද සියලුම වියදම් පිරිවැයට එකතු කර තිබේ. විශේෂිත අලුත්වැඩියාවක් මඟින් වත්කමක මූලික වශයෙන් ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය දීර්ඝ කරන්නේ නම් හෝ නැවත අය කරගත හැකි අගය වැඩි කරන්නේ නම් එම අලුත්වැඩියා කටයුතු ප්‍රාග්ධනිත කරනු ලැබේ. නඩත්තු කිරීම්, අලුත්වැඩියා සහ සුළු අලුත්වැඩියා කටයුතු සඳහා ලද ආදායම මඟින් අයකර තිබේ.

අපහරණය කරනු ලබන යටිතල පහසුකම්, පිරියත හා උපකරණවල පිරිවැය අනුරූප සමුච්චිත ක්ෂයවීම් සමඟ ශේෂ පත්‍රයෙන් ඉවත් කරනු ලැබේ. බැහැර කිරීම්වල ලාභ සහ අලාභ ඒවායේ ධාරණ අගය මත තීරණය කරනු ලබන අතර මෙහෙයුම් ලාභය තීරණය කිරීමේදී ද එය සැලකිල්ලට ගනු ලැබේ.

2. ක්ෂය වෙන්කිරීම්

ක්ෂය කිරීම් සඳහා වෙන්කිරීම් ගණනය කරනු ලබන්නේ පහත ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය තුළ එවැනි සමාන වාරිකවලින් කපා හැරීම සඳහා සියලු දේපල, පිරියත සහ උපකරණවල පිරිවැය පිළිබඳ සරල රේඛීය ක්‍රමයක් භාවිතා කිරීමෙනි.

ක්ෂයකිරීම් සඳහා පහත දැක්වෙන අනුපාතයන් භාවිතා කරනු ලැබේ.

ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍ර	10%
ගෘහභාණ්ඩ, වැද්දුම්, සවිකුරු සහ උපකරණ	10%
ආපනශාලා උපකරණ	10%
මෝටර් වාහන	10%
පරිගණක සහ මෘදුකාංග	20%
ග්‍රන්ථ සහ වාර සඟරා	10%
විද්‍යාගාර උපකරණ	10%
වීඩියෝ වැඩසටහන්	25%
කාර්මික මහන මැෂින්	10%

වර්ෂයේ පළමු භාගයේ දී අත්පත් කරගත් වත්කම් සඳහා සම්පූර්ණ ක්ෂයවීම් අනුපාතය අය කරනු ලබන අතර වසරේ දෙවන භාගය තුළ අත්පත් කර ගැනීම සඳහා 50% ක්ෂය අනුපාතය අය කරනු ලැබේ.

3. භාණ්ඩ තොග

ආයතනය විසින් සිය සේවා සැපයීමේදී භාවිතා කිරීමට සියලුම භාණ්ඩ තොග තබා ඇත. භාණ්ඩ තොග අඩු පිරිවැයකට සහ ශුද්ධ උපලබ්ධි අගයකට දක්වා තිබේ. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථම ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ ක්‍රමවේදයට (FIFO) අනුවයි.

4. වෙළඳ ලැබීම්

වෙළඳ ලැබීම් මුල් ඉන්වොයිස්පතෙහි අගයට දක්වා තිබේ.

5. මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල්, තැන්පතු සහ මාස තුනක හෝ ඊට අඩු මුල් කල්පිරීමකින් සමන්විත අනෙකුත් කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන වලින් සමන්විත වේ.

6. වෙන්කිරීම්

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස ආයතනය සතුව වර්තමාන නෛතික හෝ අර්ථකාරී බැඳියාවන් ඇති විට ප්‍රතිපාදන පිළිගනු ලැබේ. බැඳියාවන් පියවීම සඳහා සම්පත් පිටතට ගලා යාමක් අවශ්‍ය වනු ඇති අතර, බැඳියාවන් ප්‍රමාණය පිළිබඳ විශ්වාසදායක තක්සේරුවක් කළ හැකිය.

7. විදේශ මුදල් ගණුදෙනු

ගණුදෙනු කරන දින වල පවතින විනිමය අනුපාත මත විදේශ මුදල් **ගණුදෙනු** සඳහා ගිණුම්ගත කරනු ලබන අතර එම **ගණුදෙනු** පියවීමෙන් ලැබෙන ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

8 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 දරන පාරිතෝෂික පනත සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19 (LKAS 19) යටතේ ආයතනයේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවකයින් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දේ. මූලික වැටුපට ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවන දීමනාවද ඇතුළත් වේ.

9. නිශ්චිත දායකත්ව සැලැස්ම

ආයතනයේ සියලුම සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සාමාජිකයන් වන අතර, එම සේවකයන්ගේ මූලික වැටුපෙන් පිළිවෙළින් 12% සහ 3% ජීවන වියදම් දීමනාව සහ අනෙකුත් විශේෂ ජීවන දීමනා සමඟ ආයතනය දායකත්වය දක්වනු ලැබේ.

10. ආදායම් හඳුනාගැනීම

ශුද්ධ වට්ටම් සහිතව සේවා අලෙවිය සඳහා වන ඉන්වොයිස්පත් වටිනාකම අනුව උපචිත පදනමක් මත ආදායම හඳුනාගනු ලැබේ.

11. වියදම්

උපචිත පදනම මත වියදම් හඳුනාගනු ලැබේ. ආයතනය පවත්වාගෙන යාමේදී සහ දේපල, පිරියත සහ උපකරණ කාර්යක්ෂමව පවත්වාගෙන යාමේදී දරන ලද සියලුම වියදම් එම කාලසීමාව සඳහා ලාභය අත්කරගැනීමේ ආදායමට අයකර තිබේ.

12. මුදල් ප්‍රවාහය

වක්‍ර ක්‍රමය පදනම් කරගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය සකස් කර තිබේ.

13. රජයේ ප්‍රදාන

වත්කම් සහ මූල්‍ය නොවන ප්‍රදාන ආශ්‍රිත රජයේ ප්‍රදාන රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන් අනුව ගණනය කරනු ලැබේ. ප්‍රදානය ලැබෙනු ඇති බවට සාධාරණ සහතිකයක් ඇති විට සහ අදාළ සියලුම කොන්දේසි වලට අනුකූල වන විට ප්‍රදාන හඳුනාගැනේ. ප්‍රදානය වියදම් අයිතමයකට අදාළ වන විට එය හානිපූරණයට අදහස් කරන පිරිවැයට ක්‍රමානුකූල පදනමක් මත ප්‍රදානය ගැලපීමට අවශ්‍ය මුළු කාලසීමාව තුළ ආදායමක් වශයෙන් හඳුනාගැනේ. ප්‍රදානය වත්කමකට අදාළ වන විට එය විලම්භිත ආදායමක් ලෙස සකසනු ලැබේ. ආයතනය විසින් මූල්‍ය නොවන ප්‍රදාන ලබන විට වත්කම් සහ එම ප්‍රදාන නාමික ප්‍රමාණවලින් සටහන් කර සමාන වාර්ෂික වාරිකවලින් අදාළ වත්කම්වල අපේක්ෂිත ප්‍රයෝජනවත් ජීව කාලය පිළිබඳ ආදායම් ප්‍රකාශනය වෙත මුදා හරිනු ලැබේ.

පොදු අනාවරණය කිරීම

1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 සහ 11 හි දක්වා ඇති මාර්ගෝපදේශ අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබේ.

2. **භාණ්ඩාගාර බිල්පත්, ස්ථාවර තැන්පතු සහ ඇමතුම් තැන්පතුවල ආයෝජනය**

භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජන සහ ස්ථාවර තැන්පතු වල ආයෝජනය ගිණුම්වල සමුච්චිත වටිනාකමින් දක්වා ඇත.

3. **බොල් ණයගැතියන් සඳහා වෙන්කිරීම්**

වෙළඳ ලැබීම් අඩු කිරීම යටතේ බොල් ණයගැතියන් සම්බන්ධ වෙන්කිරීම් නියෝජනය වේ. ශ්‍රී ලංකාවේ මුදල් රෙගුලාසි වලට අනුකූලව ණයගැතියන් විවිධ කණ්ඩායම්වලට කාණ්ඩ කරනු ලබන අතර බොල් ණයගැතියන් සඳහා වෙන්කිරීම් අනුගමනය කරමින් ඔවුන්ගේ ගෙවීම් රටාව අදාළ කරගනු ලැබේ

කාල සීමාව	**වෙන්කිරීම් ප්‍රතිශතය**
දින <90	0%
දින 90 සිට180 දක්වා	2%
දින 180 සිට 360 දක්වා	3%
දින 360 සිට 720 දක්වා	4%
දින 720සිට 1080 දක්වා	5%
දින >1080	100%

4. **භාණ්ඩ තොග**

ආයතනය විසින් සිය සේවා සැපයීමේදී භාවිතා කිරීමට සියලුම භාණ්ඩ තොග තබාගෙන සිටියි. භාණ්ඩ තොග ප්‍රකාශ කර ඇත්තේ පිරිවැයෙන් අඩු සහ ශුද්ධ උපලබ්ධි අගයෙනි. පිරිවැය තීරණය කරනු ලබන්නේ ප්‍රථමයෙන් ලබාගත් භාණ්ඩ ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (FIFO) ක්‍රමය භාවිතා කරමිනි.

5. පාරිතෝෂික වෙන්කිරීම්

2014 වර්ෂයේ සිට පාරිතෝෂික ප්‍රතිපාදනවල මුළු මුදල ස්ථාවර තැන්පතු මත ආයෝජනය කර ඇති අතර විශ්‍රාම පාරිතෝෂික ශීර්ෂය යටතේ දක්වා තිබේ

6. **රජයේ ප්‍රදාන**

ප්‍රදාන වලින් ප්‍රාග්ධන මිලදී ගැනීම්වල ක්ෂයවීම් කොටස විලම්භිත ආදායම වශයෙන් ගිණුම්ගත කරනු ලැබේ.

7. **ප්‍රත්‍යාගණනය**

ප්‍රත්‍යාගණන වාර්තාව සම්පූර්ණ කිරීම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ ඉදිරිපත් කර නොතිබිණි.

8. වත්කම් බැහැරකිරීම

බැහැර කිරීමේ ක්‍රියාවලිය සහ සියලුම ගැලපීම් වර්ෂය තුළ අවසන් කරන ලදී.

9. කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම්

මෙම වසර සඳහා කාර්ය මණ්ඩල සංවර්ධන අරමුදල සඳහා වෙන්කිරීම් භාණ්ඩාගාර අනුමැතියට යටත්ව පනතට අනුව ප්‍රතිසාධනය මත 0.5% ක් වශයෙන් ගණනය කරන ලදී.

10. ප්‍රාග්ධන ප්‍රදාන

මේ යටතේ අමාත්‍යාංශය විසින් පහත සඳහන් ව්‍යාපෘති සඳහා අරමුදල් සපයන ලදී.

- ඇඟලුම් මෝස්තර, නව නිර්මාණ, පර්යේෂණ, සහ සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපනය කිරීම.
- පේෂකර්ම සහ ඇඟලුම් අංශයේ පර්යෙෂණ සහ ස්ථිතිමය ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම.
- බහුවිධ කුසලතා සහිත කාර්ය බලකායක් සංවර්ධනය කිරීම.

11. ව්‍යාපෘති

ව්‍යාපෘති පහක් ආරම්භ කරන ලද අතර ඉන් ව්‍යාපෘති දෙකක් අවසන් කරන ලදී. අනෙක් ව්‍යාපෘති තුන 2022 වර්ෂයේ දී අවසන් වීමට නියමිතය. **බතික්, අත් යන්ත්‍ර හා දේශීය ඇඟලුම් නිෂ්පාදන** රාජ්‍ය අමාත්‍යාංශයෙන් හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ව්‍යාපෘති සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලැබුණි.

i. යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන්

අනු අංකය	යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන	වියදම (රු. මිලි)	භෞතික ප්‍රගතිය	
			ප්‍රමාණය	ප්‍රතිශතය
1	නව තාක්ෂණය යොදා ගනිමින් පුහුණු කිරීම් සඳහා දැනට පවතින පංති කාමර වල පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා උපකරණ මිලදී ගැනීම	17.06	අත්තිවාරම සම්පූර්ණ කර ඇත. කොන්ක්‍රීට් කණු සඳහා පාදම නිම කර ඇත. පළමු මහලේ කොන්ක්‍රීට් ස්ලැබ් සම්පූර්ණ කර ඇත.	100% 100% 55%
2	පංති කාමර සඳහා ගෘහ භාණ්ඩ	6.6	පන්ති කාමර සඳහා පුටු - 300 දේශකයින් සඳහා පුටු- 06 පන්ති කාමර සඳහා මේස- 150 ඇලුමිනියම් ආවරණය සහිත මැගී බෝර්ඩ- 06 වායු සමීකරණ යන්ත්‍ර- 12	62%

ii. **අනෙකුත් ව්‍යාපෘති**

බතික්**,** අත් යන්ත්‍ර හා දේශීය ඇඟලුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනලද වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	වියදම (රු. මිලි)	භෞතික ප්‍රගතිය	
			ප්‍රමාණය	ප්‍රතිශතය
1	බතික් පුහුණුව		973	86.87%
2	බතික් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම	18.4	56	93.33%

කර්මාන්ත අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරනලද වැඩසටහන්

අනු අංකය	වැඩසටහන	වියදම (රු. මිලි)	භෞතික ප්‍රගතිය	
			ප්‍රමාණය	ප්‍රතිශතය
1	කුසලතා සංවර්ධන පාඨමාලාව	4	වැඩසටහන් -07 පුහුණු ලාභීන් -110	100% 104.76%

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අරමුදල් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති

අනු අංකය	වැඩසටහන	වියදම (රු. මිලි)	භෞතික ප්‍රගතිය	
			ප්‍රමාණය	ප්‍රතිශතය
1	ඵලදායිතාව වැඩිදියුණු කිරීම	2.13	කර්මාන්තශාලා -05	71.42%
2	ඵලදායි බහු කුසලතා බහුකාර්ය සාධන බලකා ව්‍යාපෘතියක් සංවර්ධනය කිරීම	5.42	පුහුණු ලාභීන් -200	50%
3	සම් භාණ්ඩ සහ පාවහන් ක්ෂේත්‍ර ධාරිතා සංවර්ධනය	8.05	වැඩසටහන් -10 පුහුණු ලාභීන් -150	100%

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

2021 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

		2021	2020
		Rs.	Rs.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1.1	148,983,040	19,658,807
කෙටි කාලීන ආයෝජන	1.2	262,129,359	265,430,130
ලැබිය යුතු මුදල්	2	37,913,380	51,041,649
භාණ්ඩ තොග	3	2,931,033	2,993,173
පෙර ගෙවුම්	4	2,242,656	1,240,833
ප්‍රාග්ධන කාර්යයන් සඳහා පෙරගෙවුම්	5	20,822,434	3,762,601
වෙනත් ජංගම වත්කම්	6	7,267,116	9,376,211
මුළු ජංගම වත්කම්		482,289,019	**353,503,404**
ජංගම නොවන වත්කම්			
යටිතල පහසුකම්, පිරියත සහ උපකරණ (ශුද්ධ)	7	93,634,440	98,571,610
ඉඩම් හා ගොඩනැගිලි (ශුද්ධ)	8	84,452,376	61,738,108
		178,086,816	**160,309,719**
මුළු වත්කම්		660,375,834	**513,813,122**
වගකීම්			
ජංගම වගකීම්			
ගෙවිය යුතු මුදල්	9	13,427,291	14,807,171
කෙටි කාලීන ප්‍රතිපාදන	10	2,776,388	2,984,900
		16,203,679	17,792,071
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂික	11	48,214,906	50,956,958
		48,214,906	50,956,958
මුළු වගකීම්		64,418,585	**68,749,029**
මුළු වත්කම්		595,957,250	**445,064,094**
ශුද්ධ වත්කම්/ ස්කන්ධ			
රජයේ දායකත්වය සහ විදේශාධාර	12	216,077,975	141,225,370
වෙනත් ව්‍යාපෘති	13	63,942,332	27,293,819
සමුච්චිත අතිරික්තය (අඩුකළා)	14	315,936,943	276,544,905
මුළු ශුද්ධ වත්කම් / අතිරික්තය		595,957,250	**445,064,094**

ගිණුම් ප්‍රතිපත්ති සහ විස්තරාත්මක සටහන් මෙම මූල්‍ය ප්‍රකාශන වලම කොටසක් වේ.
(වරහන් තුළ ඇති සංඛ්‍යා මඟින් අඩුකිරීම් දැක්වේ).
මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අනුකූල වේ

.....
ඊ.ඩබ්.ඒ.අයි.සිරිවර්ධන මහතා
ගණකාධිකාරී

.....
පී.එස්.ඩබ්ලිව්.කේ.ප්‍රනාන්දු මහතා
අධ්‍යක්ෂ ජනරාල්

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරනු ලැබේ.
මෙම මූල්‍ය ප්‍රකාශන 2022.02.24 දින අධ්‍යක්ෂ මණ්ඩලය
විසින් අනුමත කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත
නිලධාරීන් අත්සන් තබන ලදී.

.....
කේ.ජී.ආර්.විමලසූරිය මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

.....
බී.එල්.ඒ.ජේ.ධර්මකීර්ති මහතා
සභාපති

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

		2021	2020
	සටහන	රු.	රු.
ආදායම්			
ගාස්තු සහ වෙනත්	15	198,109,924	162,175,048
මුළු මෙහෙයුම් ආදායම		198,109,924	162,175,048
වියදම්			
පුද්ගල පඩිනඩි (වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ)	16	107,038,328	109,599,533
ගමන් වියදම්	17	778,100	547,900
සැපයුම් සහ භාවිතා කළ පාරිභෝගික භාණ්ඩ	18	9,644,611	8,200,952
අලුත්වැඩියා සහ නඩත්තු	19	5,744,261	11,281,053
ගිවිසුම්ගත සේවා	20	16,961,030	15,616,951
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	21	27,511,216	25,637,035
වෙනත් වියදම්	22	17,148,310	12,871,288
මූල්‍ය පිරිවැය	23	252,566	75,148
		(185,078,422)	(183,829,861)
මෙහෙයුම් ක්‍රියාකාරම් වලින් ලද අතිරික්තය/ (හිඟය)		13,031,502	(21,654,813)
වෙනත් ආදායම්			
විලම්භිත ආදායම	24	24,407,876	23,110,221
මුළු වෙනත් ආදායම්		24,407,876	23,110,221
කාලසීමාව සඳහා මුළු අතිරික්තය/ (හිඟය)		37,439,379	1,455,408

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

2021 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා		2021	2020
	සටහන	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			
වර්ෂය සඳහා අතිරික්තය/ (හිඟය)		**37,439,379**	**1,455,408**
ගැලපුම්			
ක්‍රමක්ෂයවීම් - ක්ෂය ආදායම	24	(24,407,876)	(23,110,221)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද පොළී ආදායම		(15,603,589)	-
බැහැරකිරීම් (ලාභය)/ අලාභය		(157,824)	4,004
ක්ෂයවීම්	21	27,511,216	25,637,035
කාරක ප්‍රාග්ධන වෙනස්වීම් වලට පූර්ව මෙහෙයුම් අතිරික්තය/ (හිඟය)		**24,781,305**	**3,986,226**
පාරිතෝෂික සඳහා වෙන්කිරීම් වැඩිවීම		3,604,429	8,584,374
භාණ්ඩ තොග (වැඩිවීම්)/ අඩුවීම්		62,139	(361,889)
පෙරගෙවුම් (වැඩිවීම්)/ අඩුවීම්		(1,001,824)	(67,873)
වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්)/ අඩුවීම්		2,109,095	1,279,198
වෙළඳ සහ වෙනත් ලැබීම් (වැඩිවීම්)/ අඩුවීම්		14,549,521	(1,854,771)
පූර්ව වර්ෂයේ ක්ෂයවීම් (වැඩිවීම්)/ අඩුවීම්		1,952,660	(290,405)
වෙනත් ජංගම වත්කම් (වැඩිවීම්)/ අඩුවීම්		(1,379,881)	(2,084,889)
වෙන්කිරීම් වැඩිවීම්		(208,512)	1,181,605
වැරදි නිවැරදි කිරීම් - සමුච්චිත ක්ෂය පොත් සහ වාරසහරා		-	146,441
ගෙවන ලද පාරිතෝෂික		(6,346,480)	(1,538,460)
මෙහෙයුම් කියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**38,122,453**	**8,979,557**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			
පිරියත සහ උපකරණ අත්පත්කරගැනීම		(45,288,738)	(36,413,082)
ආයෝජන ඇප තැන්පතුවල ශුද්ධ වෙනස්වීම්		3,300,771	(19,424,662)
ප්‍රාග්ධන වියදම් සඳහා අත්තිකාරම් ගෙවීම්		(17,059,833)	18,340,160
වත්කම් බැහැරකිරීම්		158,249	88,560
ලද පොළී ආදායම		14,182,337	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(44,707,214)**	**(37,409,023)**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය			
ප්‍රාග්ධන ප්‍රදාන (මුදල්)		76,950,000	-
ප්‍රාග්ධන ප්‍රදාන දෝෂ නිවැරදිකිරීම්		9,900,000	-
ප්‍රාග්ධන ප්‍රදාන (වත්කම්)		12,410,481	2,402,862
වෙනත් ව්‍යාපෘතිවල වෙනස්වීම්		36,648,513	24,553,747
වෙනත් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**135,908,994**	**26,956,609**
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්)		**129,324,233**	**(1,472,857)**
කාලසීමාව ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		**19,658,807**	**21,131,665**
කාලසීමාව අවසානයේදී මුදල් හා මුදල් සමාන දෑ	**1**	**148,983,040**	**19,658,807**

උපලේඛන අංක 01

මුදල් හා මුදල් සමාන දෑ	**2021**
බැංකුවේ ඇති මුදල්	
ලංකා බැංකුව -රත්මලාන (ගිණුම් අංක 9521019)	24,887,720
ලංකා බැංකුව - රත්මලාන විදෙස් මුදල් (ගිණුම් අංක 7011691)	1,591,029
කෙටි කාලීන ආයෝජන (මාස තුනට අඩු)	
භාණ්ඩාගාර බිල්පත් (පාරිතෝෂික අරමුදල)	17,504,291
ඇමතුම් තැන්පතු	105,000,000
	148,983,040

ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය

ස්කන්ධ වෙනස්වීම් ප්‍රකාශනය

2021 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

	උපලේඛන	දායකත්ව ප්‍රාග්ධනය	වෙනත් සංචිත	පරිවර්තනය	සමුච්චිත අතිරික්තය/ හිඟය	මුළු ශුද්ධ වත්කම්/ ස්කන්ධය
		රු.	රු.	රු.	රු.	රු.
2020 දෙසැම්බර් මස 31 දිනට ශේෂය	1	**168,519,189**	-	-	**276,544,905**	**445,064,094**
ගිණුම් ප්‍රතිපත්ති වෙනස්වීම්		-	-	-	-	-
වර්ෂය තුළ ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම්	2	111,501,118	-		1,952,660	113,453,777
දේපළ ප්‍රත්‍යාගණන ලැබීම්		-	-	-	-	-
ආයෝජන ප්‍රත්‍යාගණන අලාභ		-	-	-	-	-
විදේශ මුදල් පරිවර්තන අලාභ		-	-	-	-	-
ස්ථාවර වත්කම්/ ස්කන්ධ තුළ සෘජුව හඳුනාගත් ශුද්ධ ආදායම්		111,501,118	-	-	1,952,660	113,453,777
කාලසීමාව සඳහා අතිරික්තය/ හිඟය		-	-	-	37,439,379	37,439,379
කාලසීමාව සඳහා හඳුනාගත් මුළු ආදායම්						-
2021 දෙසැම්බර් මස 31 දිනට ශේෂය		**280,020,307**	**-**	**-**	**315,936,943**	**595,957,250**

<u>උපලේඛන අංක 01</u> රු.

දායකත්ව ප්‍රාග්ධනය

2020.12.31 දිනට රජයේ දායකත්වය සහ විදේශාධාර	141,225,370
2020.12.31 දිනට වෙනත් ව්‍යාපෘතිවල මුළු ශේෂය	27,293,819
	168,519,189

<u>උපලේඛන අංක 02</u>

වර්ෂය තුළ ශුද්ධ වත්කම්/ ස්කන්ධ වෙනස්වීම්

වර්ෂයේ ප්‍රාග්ධන ප්‍රදාන	99,260,481
වර්ෂය තුළ වත්කම් ක්‍රමක්ෂයවීම	(24,407,876)
වර්ෂය තුළ වෙනත් ව්‍යාපෘතිවල වෙනස්වීම්	36,648,513
	111,501,118

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

	2021 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා		**2021**	**2020**
			රු.	රු.
1.1	**මුදල් හා මුදල් සමාන දෑ**			
	බැංකුවේ ඇති මුදල්			
	ලංකා බැංකුව රත්මලාන (ගිණුම් අංක 9521019)		24,887,719.90	1,242,957.35
	ලංකා බැංකුව රත්මලාන විදෙස් මුදල් (ගිණුම් අංක 7011691)		1,591,029.11	1,739,462.81
	ඇමතුම් තැන්පත් (මාස තුනට අඩු)		105,000,000.00	-
	භාණ්ඩාගාර තැන්පතු		17,504,291.15	16,676,387.27
			148,983,040.16	**19,658,807.43**
1.2	**කෙටි කාලීන ආයෝජන**			
	ස්ථාවර තැන්පතු (පාරිතෝෂික අරමුදල)		5,172,123.69	4,777,943.39
	ඇමතුම් තැන්පතු (පාරිතෝෂික අරමුදල ඇතුළත්ව 2021 - රු. 43,042,782.31)		256,957,235.13	260,652,186.46
			262,129,358.82	**265,430,129.85**
2	**ලැබියයුතු මුදල්**			
	වෙළඳ ලැබීම්			
	පරීක්ෂා කිරීමේ ණයගැතියෝ	**2.1**	23,547,194.25	38,158,217.00
	පුහුණු - අභ්‍යන්තර ණයගැතියෝ	**2.2**	8,046,882.80	7,491,012.80
	පුහුණු - බාහිර ණයගැතියෝ	**2.3**	161,600.00	161,600.00
	උපදේශන සේවා ණයගැතියෝ	**2.4**	93,558.88	268,558.88
	පාරිභෝගික/ තාක්ෂණික සේවා ණයගැතියෝ	**2.5**	76,646.00	92,556.00
	වෙනත් වෙළඳ ණයගැතියන්	**2.6**	373,494.70	1,919,001.45
			32,299,376.63	**48,090,946.13**
	අඩුකළා - බොල් ණය සඳහා වෙන්කිරීම්		(4,876,547.15)	(5,126,099.54)
			27,422,829.48	42,964,846.59
	විවිධ ණයගැතියෝ	**2.7**	10,490,550.93	8,076,802.84
			37,913,380.41	**51,041,649.43**
2.1	**පරීක්ෂා කිරීමේ ණයගැතියෝ**			
	ඒසිආර්අයි ඇපරල්ස්		4,000.00	-
	ඇල්ෆා ඇපරල්ස්		-	98,600.00
	බෑම් නිට්ං (පුද්.) සමාගම		38,100.00	38,100.00
	බර්නාර්ඩ් ෆිල් නිට් (සිලෝන්) සමාගම		12,250.00	-
	බ්‍රැන්ඩික්ස් ඇපරල් සමාගම		19,317.75	19,317.75
	බ්‍රැන්ඩික්ස් ඇපරල් සමාගම - එෆ්සී		2,761.20	2,761.20
	බ්‍රැන්ඩික්ස් කැෂුවල් වෙයාර් සමාගම - එෆ්සී		1,727.52	1,727.52
	බ්‍රැන්ඩික්ස් ෆාස්ට් ෆැෂන්		3,850.00	-
	බ්‍රැන්ඩික්ස් ෆිනිෂිං සමාගම		29,900.00	-
	බ්‍රැන්ඩික්ස් ඉන්ටිමේට් ඇපරල් සමාගම		4,830.00	4,830.00
	කැලිකෝ (පුද්ගලික) සමාගම		6,050.00	4,950.00
	කැස්මෝ ලෝඩ්ස්ටාර් (පුද්) සමාගම - පරීක්ෂණ		14,950.00	-
	සිලෝන් ලෙදර් ප්‍රොඩක්ට්ස් මැනුෆැක්චරිං සමාගම		39,400.00	-
	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව		33,450.00	33,450.00
	ක්ලිෆ්ටෙක්ස් ඉන්ඩස්ට්‍රීස් සමාගම		-	950.00
	පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය		5,255.04	5,255.04
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - පාසැල් නිලඇඳුම්		2,081,889.00	13,372,245.00
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස් - පාසැල් නිලඇඳුම්		-	4,142,800.00
	දංකොටුව ඒවිං මිල්ස් - පාසැල් නිලඇඳුම්		5,049,874.50	-
	සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව		184,350.00	-
	කර්මාන්ත දෙපාර්තමේන්තුව (බස්නාහිර පළාත)		10,100.00	-
	ආගමන විගමන දෙපාර්තමේන්තුව		1,408.18	1,433.18
	මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව		-	1,900.00
	වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව		97,600.00	-
	ඩීජී ෆැෂන්ස් ගාමන්ට් (පුද්) සමාගම		7,539.84	7,539.84
	ශ්‍රී ලංකා යුධ හමුදා යුධෝපකරණ බලකාය		248,600.40	248,600.40
	එක්ෂෝ ඉන්ඩස්ට්‍රිස්		(757.50)	-
	ශ්‍රී ලංකා සූරාබදු දෙපාර්තමේන්තුව		25.00	-
	රෙදිපිළි තාක්ෂණ දෙපාර්තමේන්තුව		-	16,050.00
	ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය		22,111.05	22,111.05
	ජෙනුයින් ටිෂර්ට්		3,450.00	3,450.00
	හම්ඩියා ස්ටෝර්ස් පුද්ගලික සමාගම		31,500.00	-
	හර්ෂ ඉන්ටර්නැෂනල් සමාගම		-	88,000.00
	හෙළ ක්ලෝදින් (පුද්) සමාගම		570.80	570.80
	හෙළ ක්ලෝදින් පුද් සමාගම - එෆ්සී		44,999.21	44,999.21
	හෙළ මාර්කට්ං ඇන්ඩ් ඩිසයින් සෙන්ටර්		9,775.00	9,775.00
	ඉරෝෂා ඉන්ටර්නැෂනල්		-	2,155.75

	කබීර් හැන්ඩ්ලූම්	29,295.68	29,295.68
	කිෂානි ඉන්ඩස්ට්‍රිස් (පුද්) සමාගම	6,600.00	-
	නිට්ං වර්ල්ඩ් සිලෝන්	25,250.00	-
	කුගා හෝල්ඩිංස් (පුද්) සමාගම	-	1,400.00
	සී/ස ලංකා ඉලෙක්ට්‍රිසිටි සමාගම	-	173,400.00
	ලලාන් රබර් (පුද්) සමාගම - එල්එන් ත්‍රෙඩ්	30,500.00	-
	ලංකා සලුසල	98,096.80	36,896.30
	මාර්ෂල් ට්‍රේඩිං කම්පැනි	7,650.00	7,650.00
	මාස් ඇක්ටිව් (පුද්) සමාගම - ලීනියා ඉන්ටිමෝ	129,000.00	90,600.00
	මාස් ඇක්ටිව් (පුද්) සමාගම	4,182.00	4,182.00
	මාස් ඉන්ටිමේටිස් (පුද්) සමාගම	2,600.00	2,600.00
	ආරක්ෂක අමාත්‍යාංශය	(900.00)	-
	අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	6,740.16	6,740.16
	අධ්‍යාපන අමාත්‍යාංශය	-	166,800.00
	කරමාන්ත හා වාණිජ අමාත්‍යාංශය	-	4,306,291.10
	මිරාජ් ඉන්ඩස්ට්‍රිස් - හමුදා නිලඇඳුම්	21,134.40	21,134.40
	නිව් යුනික් සප්ලයර්ස්	16,330.00	-
	නොයොන් ලංකා (පුද්) සමාගම	7,550.00	-
	පැන් ඒෂියා කලර්ඩ් යාන් (පුද්) සමාගම	8,500.00	-
	ෆාතිමා වීවින් මිල්ස්	13,800.00	-
	පෙන්ගුවින් ලෙෂර් වෙයාර් (පුද්) සමාගම	26,128.58	26,128.58
	පොලිස් මූලස්ථානය	141,308.94	111,908.94
	ප්‍රභා ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රිස් - පාසැල් නිලඇඳුම්	10,985,952.00	4,747,100.00
	ප්‍රභා ටෙක්ස්ටයිල් ඉන්ඩස්ට්‍රිස් - හමුදා නිලඇඳුම්	22,800.00	22,175.00
	ප්‍රෙස්කෝ ඉන්ටර්නැෂනල්	16,600.00	-
	රේඩියන්ට් ටෙක්ස්ටයිල්	2,463.30	2,463.30
	රෙයින්වෙයාර් ඇපරල් (පුද්) සමාගම	-	1,600.00
	රජිත ටෙකස් - පාසැල් නිලඇඳුම්	-	157,700.00
	රතන්ජනා ටෙක්ස්ටයිල්ස්	16,832.55	16,832.55
	ලේඛකාධිකාරී -මහේස්ත්‍රාත් උසාවිය	49,999.99	49,999.99
	රයිනෝ කන්සල්ටන්ටන්ස් ඇන්ඩ් ෆැසිලිටේර්ස්	13,000.00	33,600.00
	සරසවි ඉන්ඩස්ට්‍රිස් - හමුදා නිලඇඳුම්	31,050.00	96,800.00
	එස්.ජී.එස්.ලංකා (පුද්) සමාගම	75,050.00	11,850.00
	ෂින්සි ලංකා (පුද්) සමාගම	12,850.47	12,850.47
	සින් මාර් කළමිබු (පුද්) සමාගම	-	50,375.00
	සවුත් ඒසියා ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ්	3,800.00	-
	ස්පෙන්සර් ඩෙනිම් ඉන්ඩස්ට්‍රිස් (පුද්) සමාගම	1,583.55	1,583.55
	ශ්‍රී ලංකා මුදා මූලස්ථානය	240,400.00	1,018,250.00
	ශී ලංකා යුධ හමුදාව	85,445.32	85,445.32
	ශ්‍රී ලංක රේගුව	17,595.00	17,595.00
	ශ්‍රී ලංකා හෝම් ගාඩ් ෆෝසස්	17,250.00	17,250.00
	ශ්‍රී ලංකා නාවික හමුදාව	636,486.94	443,036.94
	ශ්‍රී ලංකා යුධ හමුදාව	16,205.00	104,305.00
	එස් ඇන්ඩ් එස් සේෆ්ටි ඉක්විප්මන්ට් හෝල්ඩිංස්	23,973.10	23,973.10
	කාන්තා හා ළමා සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය	445,000.00	-
	සුපර් ෆැෂන් ගාමන්ට්	523.43	523.43
	ටෙක්ස්ප්‍රින්ට් ලංකා (පුද්) සමාගම	3,550.00	3,000.00
	ට්‍රයිස්ටාර් ඇපරල් එක්ස්පෝර්ට් (පුද්) සමාගම	790.00	790.00
	ටී ඇන්ඩ ටී ෆැෂෙන්ස්	1,900.00	-
	වැන්ගාඩ් ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ්	8,722.00	8,722.00
	වැන්ගාඩ් ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ් - පාසැල් නිලඇඳුම්	2,226,812.00	5,558,150.00
	වැන්ගාඩ් ඉන්ඩස්ට්‍රිස් ලිමිටඩ් - හමුදා නිලඇඳුම්	2,700.00	2,510,431.40
	වර්වූ ටෙප් ඉන්ඩස්ට්‍රිස්	2,700.00	2,700.00
	විනර් ගයිස්	2,516.05	2,516.05
		23,547,194.25	**38,158,217.00**

2.2 අභ්‍යන්තර පුහුණු - ණයගැතියෝ

සිසුන්ගෙන් ලැබිය යුතු පාඨමාලා ගාස්තු	6,952,905.00	6,539,035.00
ගුවන් හමුදා සේවා වනිතා ඇහලුම් කම්හල (කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය)	20,400.00	20,400.00
අල්ෆා අපරල්ස් සමාගම	16,200.00	16,200.00
සෙල්සියස් (පුද්.) සමාගම	46,000.00	46,000.00
ඩයිනමික් ක්ලෝදින් (පුද්.) සමාගම	7,650.00	7,650.00
එලගන්ට් නිට්ං	142,000.00	-
එවරස්ට් ෆුවවෙයාර් ඉන්ඩස්ට්‍රිස්	40,800.00	40,800.00
ජයාස් අර්වින්ද් එන්ටර්ප්‍රයිසස් සමාගම	118,320.00	118,320.00
නෝඩෙක්ස් (පුද්) සමාගම	54,840.00	54,840.00
එන්පීඑන් පෙරේරා ඇන්ඩ් කම්පැනි (පුද්) සමාගම	40,800.00	40,800.00
ඔබයදානි ඇපරල් (පුද්) සමාගම	127,500.00	127,500.00
ගනුදෙනුකරුවන් සඳහා එක් වරක් පමණක් පවත්වන පුහුණුව	353,398.20	353,398.20
පැරඩයිම් ක්ලෝදින් (පුද්) සමාගම	3,750.00	3,750.00
පර්ලි ෆැෂන්	30,600.00	30,600.00
ප්‍රීම් ඉන්ටිමේටිස් ලංකා පුද්ගලික සමාගම	25,600.00	25,600.00
රුසිරුමල් (පුද්ගලික) සමාගම	1,000.00	1,000.00
ශ්‍රී ලංකා යුධ හමුදාව	4,000.00	4,000.00
ටෙක්ස්වර්ඩ් ජර්සි (පුද්) සමාගම	46,350.00	46,350.00
ට්‍රිග් ඇපරල් (පුද්) සමාගම	14,769.60	14,769.60
	8,046,882.80	**7,491,012.80**

2.3	**ණයගැතියන් සඳහා බාහිර පුහුණුව**		
	කේන් ඇපරල්	10,200.00	10,200.00
	ලංකා /ගාමන්ට්ස් මැනුෆැක්චරිං (පුද්) සමාගම	7,500.00	7,500.00
	පැටර්න් ගාමන්ට් (සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය)	12,500.00	12,500.00
	ක්වින්ස් වර්ක්වෙයාර්	30,000.00	30,000.00
	ශාස් වෙයාර් (පුද්) සමාගම	30,600.00	30,600.00
	එස්ජීකිව් ඇපරල්	30,000.00	30,000.00
	ශ්‍රී ලංකා යුධ හමුදා යුධෝපකරණ කර්මාන්ත ශාලාව	40,800.00	40,800.00
		161,600.00	**161,600.00**
2.4	**උපදේශන සේවා - ණයගැතියන්**		
	ක්‍රියේටිව් ටෙක්ස්ටයිල් මිල්ස්	10,000.00	10,000.00
	සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව	1,730.40	1,730.40
	පත්මා ඩිස්ට්‍රිබියුටර්ස්	2,203.20	2,203.20
	පොලිස් මූලස්ථානය	18,506.88	18,506.88
	සිල්වර් මිල්ස් (පුද්) සමාගම	-	175,000.00
	විශේෂ කාර්ය බලකාය	22,505.28	22,505.28
	ශ්‍රී ලංකා රේගුව	13,708.80	13,708.80
	ශ්‍රී ලංකා නාවික හමුදාව	24,904.32	24,904.32
		93,558.88	**268,558.88**
2.5	**පාරිභෝගික/ තාක්ෂණික සේවා - ණයගැතියන්**		
	ඩී ඒ ජී ඇපරල්	5,440.00	-
	ලංකා සලුසල ලිමිටඩ්	4,250.00	-
	නෝර්ඩෙක්ස් (පුද්) සමාගම	3,300.00	3,300.00
	පොලිස් හෙඩ් ක්වාටර්ස්	25,806.00	25,806.00
	ශ්‍රී ලංකා ඇපරල්	17,650.00	17,650.00
	ශ්‍රී ලංකා යුධහමුදා මූලස්ථානය	-	22,000.00
	යසිදු ටෙක්ස්ටයිල්	10,200.00	23,800.00
	වැන්ගාර්ඩ් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්	10,000.00	-
		76,646.00	**92,556.00**
2.6	**වෙනත් වෙළඳ ණයගැතියෝ**		
	බෙයාපූට් (පුද්) සමාගම	2,500.00	2,500.00
	ෆිඩෙලිටි මැනුෆැක්චරිං (පුද්) සමාගම	200.00	200.00
	ෆෝට් හෙල්ත්කෙයාර් (පුද්) සමාගම	3,240.00	3,240.00
	මධුෂානි ඒවිං	4,259.00	-
	මාස් කැපිටල් (පුද්) සමාගම	46,920.00	46,920.00
	මාස් ඉන්ටිමේටිස් (පුද්.) සමාගම	82,516.86	82,516.86
	මාස් කැජ් ටීම්	800.00	800.00
	අධ්‍යාපන අමාත්‍යාංශය	25,000.00	1,573,872.00
	ඔරියන්ට් ගාමන්ට්ස් සමාගම සෑම් - ඩයින්	8,625.00	8,625.00
	පෙරේරා ඒවිං	(893.75)	-
	ශ්‍රී ලංකා ඇඟලුම් අපනයනරුවන්ගේ මණ්ඩලය	12,000.00	12,000.00
	ශ්‍රී ලංකා යුධ හමුදා මූලස්ථානය	20,644.80	20,644.80
	අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය	161,500.04	161,500.04
	ටෙක්ස්වර්ඩ් ජර්සි ලංකා (පුද්) සමාගම	3,300.00	3,300.00
	යුනිවෙලා (පුද්) සමාගම - සායම්ගැන්වූ සාම්පල	2,882.75	2,882.75
		373,494.70	**1,919,001.45**
2.7	**විවිධ ණයගැතියෝ**		
	කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශ පාවහන් පුහුණු ව්‍යාපෘතිය	4,000,000.00	-
	විවිධ අත්තිකාරම්	937.76	40,937.76
	ස්ථාවර තැන්පතු සඳහ ලැබිය යුතු පොළිය	167,916.87	254,867.31
	භාණ්ඩාගාර බිල්පත් සඳහා ලැබිය යුතු පොළිය	67,660.50	39,858.34
	ඇමතුම්, තැන්පතු සඳහා ලැබිය යුතු පොළිය	5,979,191.28	7,341,295.06
	සුබසාධක සමිතිය	133,333.31	258,333.16
	ලංකා අශෝක් ලේලන්ඩ් (පුද්) සමාගම	43,280.50	43,280.50
	ලැබිය යුතු වැට්	98,230.71	98,230.71
		10,490,550.93	**8,076,802.84**
3	**භාණ්ඩ තොග**		
	ලිපිද්‍රව්‍ය	1,103,618.19	1,090,185.33
	පුහුණු උපකරණ හා පාරිභෝගික ද්‍රව්‍ය	1,481,127.54	1,480,698.89
	සායම් සහ තූල්	149,430.00	225,431.00
	අමතර කොටස් සහ උපාංග	196,857.30	196,857.30
		2,931,033.03	**2,993,172.52**

4	**පෙරගෙවුම්**			
	රක්ෂණය - වෛද්‍ය		1,419,859.80	214,784.70
	රක්ෂණය - මෝටර් වාහන		304,607.24	335,256.39
	රකෂණය - ගිනි සහ වෙනත්		121,288.55	121,288.55
	රක්ෂණය - සංක්‍රමණ මුදල්		9,479.29	9,479.29
	සේවා ගිවිසුම් - ඉඩම් සහ ගොඩනැඟිලි		4,100.00	-
	සේවා ගිවිසුම් - පරිගණක		86,432.23	96,871.25
	සේවා ගිවිසුම් - ගෘහභාණ්ඩ හා උපකරණ		21,449.40	61,416.68
	සේවා ගිවිසුම් - විදුලි ජනන යන්ත්‍ර		-	23,222.25
	සේවා ගිසුම් - විද්‍යාගාර උපකරණ		-	94,500.00
	වාහන බලපත්‍ර හා දුම් පරීක්ෂාව		25,439.69	-
	සැපයුම් - පරීක්ෂණ විද්‍යාගාරය සඳහා පැවරුම් ගාස්තු		-	34,013.54
	ඩිප්ලෝමා ප්‍රදාන උත්සවය		250,000.00	250,000.00
			2,242,656.19	**1,240,832.65**
5	**ප්‍රාග්ධන කාර්යයන් සඳහා අත්තිකාරම් ගෙවීම්**			
	ගොඩනැඟිලි ඉදිකිරීම		3,762,600.68	3,762,600.68
	පත්ති කාමර වැඩිදියුණු කිරීම, නවීකරණය සහ උසස් කිරීම		17,059,833.20	-
			20,822,433.88	**3,762,600.68**
6	**වෙනත් ජංගම වත්කම්**			
	කාර්ය මණ්ඩල ණය	**6.1**	6,846,116.16	8,955,211.34
	තැන්පතු	**6.2**	421,000.00	421,000.00
			7,267,116.16	**9,376,211.34**
6.1	**කාර්යමණ්ඩල ණය**	**(6.1)**		
	ආපදා ණය			
	ඩී.එල්.විජේතුංග මහතා		-	72,916.78
	ඩබ්ලිව්.ඒ.සී අශෝකා මිය		78,125.07	140,625.03
	ආර්.එම්.එන්.ඩී.රණසිංහ මිය		171,875.05	234,375.01
	ආර්.ඒ.ඩී.ආර්.අයි පෙරේරා මහතා		166,666.72	229,166.68
	ජේ.ඒ.ප්‍රියන්ත මහතා		98,958.43	161,458.39
	ඩී.ඒ.එම්.ප්‍රියංගිකා මිය		125,000.07	187,500.03
	ඩබ්ලිව්.එම්.ඩී.ඒ.වර්ණසූරිය මිය		135,416.74	197,916.70
	ජී.එස්.වඩුගේ මිය		250,000.00	197,916.70
	එස්.එල්.එස්.කරුණාරත්න මහතා		-	41,666.80
	ටී.ආර්.ජයතිලක මෙය		208,333.36	-
	ඊ.ඒ.ඩී.සුනීතා මිය		135,416.74	197,916.70
	පී.කේ.ආර්.එස්.ආරියරත්න මහතා		57,291.79	119,791.75
	එල්.ටී.ඩී.හෙට්ටිආරච්චි මහතා		125,000.08	187,500.04
	එම්.ඩී.යූ.ජයදාස මහතා		114,583.41	177,083.37
	ජේ.පී.ඩී.ආර්.විජේවර්ධන මහතා		239,583.34	45,000.00
	ඩී.එන්.දොඩංගොඩ මිය		145,833.40	208,333.36
	ආර්.ඒ.ඩී.ටී.ආර් සමරනායක මිය		78,125.07	140,625.03
	ජී.එස්.රංජනී මිය		156,250.06	218,750.02
	සී.ඒ.ඩී.එස් කන්ඩම්බි මිය		124,999.96	250,000.00
	ටී. බාලචන්ද්‍ර මිය		114,583.41	177,083.37
	ජේ.එම්.ඒ.එස්.ඒ.ජයකොඩි මිය		151,041.73	213,541.69
	ජේ.එම්.ඩී.ආර්.ආර්.රත්නායක මිය		83,333.41	145,833.37
	පී.ඩී.ආර්.ආර් ද සිල්වා මිය		161,458.39	223,958.35
	බී.එස්.ඒ.මැන්දිස් මිය		48,611.24	131,944.52
	ඩබ්ලිව්. එම්.එස්.කේ. විජේබාහු මහතා		5,208.49	67,708.45
	වයි.එන්.වික්‍රමනායක මහතා		156,250.06	218,750.02
	කේ.ඒ.එම්.ප්‍රියන්ත මහතා		222,222.24	159,722.28
	යූ.වික්‍රමසිංහ මහතා		5,208.49	67,708.45
	එන්.පී.එස්.එස්.කේ පතිරණ මහතා		-	48,611.24
	එච්.ටී.එම්.ඩී.දිනේශා මිය		250,000.00	177,083.37
	එස්.පී.ඒ.සත්‍යපාල මහතා		-	34,722.36
	එම්.එස්.ආර්. භානු මිය		130,208.41	192,708.37
	එස්.තෙවරප්පෙරුම මිය		93,750.10	156,250.06
	ආර්.එම්.යූ රත්නායක මහතා		187,500.04	250,000.00
	ඩී.පී.වීරරත්න මහතා		5,208.49	67,708.45
	අමාලි වතුරිකා මිය		187,500.04	41,666.54
	වයි.එම්.ද සිල්වා මිය		130,208.41	192,708.37
